# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1860/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 17/12/2024<br>පැය 1530 |

## කනිෂ්ඨ රථවාහන කළමණාකරන පාඨමාලාව හදාරන ලද නිලධරයන්ගේ විසිර යාමේ උත්සවය

මහජනතාව වෙත වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දීම අරමුණු කරගනිමින් රථවාහන මූලස්ථානය විසින් රථවාහන අංශ වල නිලධාරීන් සඳහා රථවාහන සහ මාර්ග ආරක්ෂාව සම්බන්ධව විවිධ පාඨමාලා පවත්වනු ලබයි. ඒ අනුව කනිෂ්ඨ නිලධාරීන් සඳහා රථ වාහන නීතිය මෙන්ම එහි ප්‍රායෝගික භාවිතය සම්බන්ධව අවශ්‍ය කරනු දැනුම ලබාදීම සඳහා රථවාහන කලමණාකරණ පාඨමාලාව ආරම්භ කරන ලදි.

ඒ අනුව පවත්වන ලද කණිෂ්ඨ රථවාහන කලමණාකරණ පාඨමාලාව සාර්ථකව අවසන් කරන ලද නිලධාරීන් රථවාහන අංශ වලට අනුයුක්ත පොලිස් නිලධාරීන් 197 දෙනෙකු සඳහා සඳහා සහතික පත්‍ර හා ලාංඡන ප්‍රධානය කිරීමේ උත්සවය 2024 දෙසැම්බර් 17 දින අද දින අපරාධ වාර්තා කොට්ඨාස ශ්‍රවනාගාරයේදී අපරාධ හා රථවාහන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රන්මල් කොඩිතුවක්කු මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මෙම පාඨමාලව තුලින් රථ වාහන නීතිය එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳව මෙන්ම අධිකරණයේ රථවාහන නඩු මෙහෙයවීම සම්බන්ධයෙන් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විසින් දේශණ සිදු කර ඇති අතර යතුරුපැදි ඇතුළු පොලිස් වාහන පැදවීමේ ප්‍රවීණතාවය ලබා දීම ද සිදුකරන ලදි.

මෙම අවස්ථාව සඳහා රථ වාහන පාලන හා මාර්ග ආරක්ෂාව නියෝජ්‍ය පොලිස්පති ඉන්දික හපුගොඩ මහතා, රථවාහන මූලස්ථානයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මනෝජ් රනගල මහතා ඇතුළු උසස් පොලිස් නිලධාරීන් රැසක් සහභාගී විය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්




2024.12.17




**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**